# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| දිනය Date | 2025.06.22 පැය 2340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1261/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.06.22 වන අද දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුද 35 ක් වන බඩෝවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2025.06.22 වන අද දින සවස් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ බස්නාහිර පලාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුද 34 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කිරිඳිවැල පොලිස් වසම.**

2025.06.22 වන අද දින සවස් කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ අනුරාගොඩ ප්‍රදේශයේදී කිරිඳිවැල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීම සඳහා යොදාගන්නා ගෝඩා ලීටර් 1440 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වූ අනුරාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිරිඳිවැල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. මෘත ශරීරයක් හමුවීම - කොටුව පොලිස් වසම.

2025.06.21 වන දින රාත්‍රී කාලයේ කොටුව පොලිස් වසමේ ලෝටස් පාරේ පුද්ගලයෙකු වැටී සිටින බවට ලද පණිවිඩයක් මත කොටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් එම ස්ථානයට ගොස් වැටී සිටි පුද්ගලයා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරුවී නොමැත.**

මරණකරු වයස අවුරුදු 60 ත් 65 අතර වයසේ පසුවන උස, අඩි 05 ක් පමණ වන තළෙලු පුද්ගලයෙකි. කහ සහ සුදු පැහැති කමිසයක් හා තැඹිලි පැහැති සරමක් හැද සිටී. මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

කොටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 05. දියේ ගිලී අතුරුදහන්වීමක් - කොස්ගොඩ පොලිස් වසම

2025.06.22 වන අද දින සවස් කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ කයිකාවල වෙරළ තීරයේ දිය නෑමට ගිය තරුණයින් තිදෙනෙකු අතරින් එක් තරුණයෙකු සැඩ පහරට හසුව ගසාගෙන ගොස් අතුරුදහන් වී ඇති බවට කොස්ගොඩ පොලිසියට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 27 ක් වන ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ පුද්ගලයා සොයා නාවික හමුදා ජීවිතාරක්ෂක නිලධාරීන්ගේ සහය ඇතිව කොස්ගොඩ පොලිසිය මෙහෙයුමක් දියත් කර ඇත.

## 06. මාරක රිය අනතුරක් - පොතුහැර පොලිස් වසම.

2025.06.22 වන අද දින අළුයම් කාලයේ පොතුහැර පොලිස් වසමේ කුරුණෑගල කොළඹ මාගර්යේ කුරිපොත්ත ප්‍රදේශයේදී පොල්ගහවෙල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාගර්යෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වන පොල්ගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුරුණෑගල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කොටහේන පොලිස් වසම.

2025.06.22 වන අද දින දහවල් කාලයේ කොටහේන පොලිස් වසමේ පරණ ගල්වල මාගර්යේ සිට පරණ යෝන් වීදිය හන්දිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව කන්ටේනර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන් ගත් කුඩා දැරියක් තුවාල ලබා ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 01 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කොටහේන පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - සපුගස්කන්ද පොලිස් වසම.

2025.06.22 වන අද දින උදෑසන කාලයේ සපුගස්කන්ද පොලිස් වසමේ මාකොල උඩුපිල මාගර්යේ සිට පරණ සපුගස්කන්ද ප්‍රදේශයේදී මාකොළ දෙස සිට උඩුපිල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පදික කාන්තාව බරපතල තුවාල ලබා කිරිබත්ගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පදික කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය  වයස අවුරුදු 83 ක් වන මාකොළ ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**